**ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතිය - 2023**

---------------------------------------------------------------------

ඔපෙක් අරමුදලින් මාර්ග ජාල සංවර්ධන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම අනුව, එවකට වරාය, නාවික හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

බස්නාහිර, වයඹ, මධ්‍යම, දකුණ සහ සබරගමුව පළාත්වල ජාතික මාර්ග කි.මී. 202 ක් වැඩිදියුණු කිරීමත්, පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ පුළුල් කිරීම මඟින් මාර්ග ජාල සම්බන්ධතා වැඩිදියුණු කර ප්‍රවාහන ක්ෂේත්‍රය සඳහා පවතින ඉල්ලුම සම්පූර්ණ කිරීම සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවේ ප්‍රමුඛ ස්ථානයක් ස්ථාපිත කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 7,121.32 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 62.46 ක් වන අතර ඉන් රු.මිලියන 4,560 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 40 ක් සැපයීම සඳහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සමඟ එකඟ වී තිබුණි. ඉතිරි මුදල වූ රු.මිලියන 2,561.32 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 22.46 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතියේ කටයුතු 2013 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර, 2016 දෙසැම්බර් 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපාතිය අවසන් කරන දිනය 2025 පෙබරවාරි 02 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටස් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/විගණන නිරීක්ෂණය | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව, ඉඩම් කැබලි 2,038 ක් සඳහා ඉඩම් හිමියන්ට ගෙවිය යුතු වන්දි සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | 21.50 | අත්පත් කර ගැනීම සඳහා අපේක්ෂා කරන ඉඩම් කැබලි සඳහා වන්දි මුදල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම්වරු ඔවුන්ගේ ගණනය කිරීම් මත වවුචර් සකස් කරති. අනාගතයේදී අත්පත් කර | ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර. අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සිදු කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරනු ලබන සමාලෝචනයේදී |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගැනීමට නියමිත ඉඩම් කැබලි සඳහා ප්‍රතිපාදන සිදු කිරීමට වටිනාකම ඇස්තමේන්තු කිරීම ව්‍යාපෘති කාර්යාලයට සිදු කළ නොහැක. | විශේෂ අවධානය යොමු කළ යුතු අතර ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |
| (ආ) | ඉඩම් කැබලි 2,521 ක් සඳහා වන්දි ගෙවීම් ප්‍රමාද වීම මත ඉඩම් හිමියන්ට ගෙවිය යුතු පොලිය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සිදු කර නොතිබුණි. | 75.00 | අවශ්‍ය නිවැරදි කිරීම් ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී සිදුකරණු ලැබේ. | -එම- |
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් තාවකාලිකව මූල්‍යනය කරන ලද වටිනාකම වර්ෂ දහයකට වැඩි කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් තුළ ඇතුළත් කර තිබුණි. තවද, ඉහත මූල්‍යකරණයෙහි අනුමැතිය සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 70.84 | මා.සං.අ. විසින් නිදහස් කරන ලද අරමුදල් පිළිවෙලින් 2014, 2018, හා 2019 වර්ෂවල ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඩීෆ්සීසී බැංකුව හා ලංකා බැංකුව මඟින් ලබාගත් ණයවලින් කොටසකි. එම මූල්‍යකරණයන්හි අනුමැතිය සම්බන්ධ සියළු තොරතුරු මාර්ග සංවර්ධන අධිකාරිය සතුව පවතී. | තාවකාලික මූල්‍යනයන් නිසි අනුමැතියක් යටතේ ලබා දිය යුතු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරනු ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |
| (ඈ) | 2016 වර්ෂයේ රේඛීය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණු වන්දි මුදල් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටත් පෙන්වා තිබුණි. කෙසේ වුවද, ඉහත වියදම් සඳහා වූ අනුමැතීන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 16.12 | රේඛීය අමාත්‍යාංශය විසින් මෙය ගෙවා නොතිබුණි. වන්දි ගෙවීම් සඳහා ඔවුන් විසින් අග්‍රිම නිදහස් කර තිබුණි. එම නිසා, එය මූල්‍ය ප්‍රකාශනවල හිමිකම් යටතේ රජයේ අරමුදල් අයිතමයෙහි ඇතුළත් කළ යුතුය. මෙය ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලදී නිවැරදි කරනු ලැබේ. | රජයේ දායකත්වය නිසි අනුමැතියක් යටතේ ලබා දිය යුතු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරනු ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |

## 2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| **අංකය** | **නීතිරීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ ප්‍රතිචාරය** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571 | රු.මිලියන 0.1 ක රඳවාගැනීමේ මුදල් මිනින්දෝරුවන් වෙත නිදහස් කිරීමට 2017 වර්ෂයේ සිට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කොන්ත්‍රාත් ගිවිසුමෙහි සඳහන් පරිදි සමීක්ෂණ දෙකක් සම්පූර්ණ කර නොතිබුණි. එම නිසා අවසන් කිරීමේ සහතික නිකුත් නොකරන ලදී. 2024 වර්ෂයේදී මෙම වටිනාකම කපාහැරීමේ හැකියාව සොයා බැලීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට මාරු කිරීමට ප්‍රථම විමර්ශනයක් සිදු කළ යුතු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරනු ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | කොන්ත්‍රාත් කොන්දේසි 128 උප වගන්තිය | භාරගැනීමේ සහතිකය නිකුත් කරන අවස්ථාවේදී රසායනාගාර උපකරණ හා ගෘහ භාණ්ඩ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දිය යුතුය. කෙසේ වුවද, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ අංක 4/2 පාලම නැවත ඉදිකිරීම් සම්බන්ධව 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ක්ෂේත්‍ර රසායනාගාර උපකරණ සඳහා රු.මිලියන 6 ක් එකවර (lump sum) ගෙවා තිබුණි. එම නිසා, එවැනි අහිතකර කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ගෙන දිය හැකි අතර ව්‍යාපෘති පිරිවැය ඉහළ යනු ඇත. | කොන්ත්‍රාත් කොන්දේසි අනුව ව්‍යාපෘතිය අවසානයේදී රසායනාගාර සහ මිනින්දෝරු අයිතම කොන්ත්‍රාත්කරු සතු වේ. කෙසේ වුවද, තරඟකාරී ස්වභාවය යටතේ ලංසු ආරාධනය සිදු කළ අතර අයිතමවල ක්ෂය කළ හැකි අගය මූලිකවම සළකා බලමින් මිල ගණන් කැඳවන ලදී. ලංසුකරුවන්ගේ කැඳවන ලද ලංසු මිල ගණන් සසඳන විට එය අනාවරණය වේ. | විශේෂ කොන්ත්‍රාත් කොන්දේසි බලාත්මක කිරීමට පෙර සමාලෝචනය කළ යුතුය. සේවායෝජකගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, මුදලට වටිනාකමක් තබා ගැනීම සහ කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීම වැළැක්වීම සඳහා ලංසු ලේඛණ සමාලෝචනය කිරීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය**

**(i) ඉඩම් අත්පත් කර ගැනීම**

| සංරචකය | ක්‍රියාකාරකම | 2023 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය / විගණන නිරීක්ෂණය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය කැබලි | ළඟා කරගෙන ඇති කාර්යසාධනය කැබලි | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | මාර්ග සංවර්ධන අධිකාරියට හිමිකම් පැවරීම | 2,772 | 147 | විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් ඉඩම් කැබලි 2,772 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන අතර, ඉඩම් කැබලි 730 ක් සඳහා රු.මිලියන 245.13 ක වන්දි සහ ඉඩම් කැබලි 155 ක් සඳහා රු.මිලියන 58.24 ක ප්‍රමාද පොලී 2023 දෙසැම්බර් 31 දිනට ගෙවා තිබුණි. කෙසේ වුවද, ඉඩම් අත්පත්කර ගැනීමේ | දුර්වල සුපරීක්ෂණය හේතුවෙන් ඉඩම් අත්පත්කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම. |

පනතේ 44 උප වගන්තිය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 147 ක හිමිකම පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබුණු අතර ඉන් ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගත යුතු මුළු පෞද්ගලික ඉඩම්වලින් සියයට 7.8 ක් නියෝජනය විය.

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | 2023 දෙසැම්බර් 13 දිනට 44 වන වගන්තිය යටතේ ලියාපදිංචිය සියයට 7.8 කි. 44 වන වගන්තිය යටතේ ලියාපදිංචිය කඩිනම් කිරීම සඳහා අදාල ප්‍රා.ලේ. කාර්යයාලවලට දැනුම් දී ඇති අතර ප්‍රගතිය අඛණ්ඩව සුපරීක්ෂණය කරනු ලැබේ. |
| **විගණකගේ නිර්දේශය** | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරනු ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |

(ii) **සිවිල් වැඩ**

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2023 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදය / විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදයට හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේකෂිත භෞතික කාර්යසාධනය %** | **ළඟා කරගෙන ඇති කාර්යසාධනය %** | | |
| සිවිල් වැඩ | පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ පුළුල් කිරීම | 97 | 55 සිට 74 | 2024 ජනවාරි 16 හා 2024 පෙබරවාරි 02 දින කොන්ත්‍රාත් පැකේජ RDA/MFAP/ICB/OFID-1/09 සහ RDA/MFAP/ICB/OFID-1/10 හි මූලික කොන්ත්‍රාත් කාලය ඉක්මවුවද, 2023 දෙසැම්බර් 31 දිනට පැකේජ දෙකම පිළිවෙලින් සියයට 55 ක සහ සියයට 74 ක භෞතික ප්‍රගතියක් පමණක් ලබා කර ගෙන තිබුණි. ප්‍රගති වාර්තාව අනුව, ඉදිකිරීම් ගැටළු සෘජුවම මෙම ප්‍රමාදවීම් සඳහා බලපා තිබුණු අතර මෙම ගැටළු නිරාකරණය සඳහා ව්‍යාපෘතිය විසින් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොවුණි. | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාද වීම හා දුර්වල සුපරීක්ෂණය. |

| | |
|---|---|
| **කළමනාකරණයේ ප්‍රතිචාරය** | නළ එලීම, ජල කාන්දුවීම් හා ජා.ජ.ස.හා ප.ම. හි පවතින නළවල දුර්වල තත්ත්වය හේතුවෙන් පාලම් දෙකෙහි ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය. |
| **විගණකගේ නිර්දේශය** | කාල රාමුව තුළ ව්‍යාපෘතියේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට උපරිම උත්සාහයක් ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොන්ත්‍රාත් පොදු කොන්දේසි 4.2 උප වගන්තිය (FIDIC-1999) ප්‍රකාරව, කොන්ත්‍රාත්කරු විසින් ඔහුගේ වියදමින් කාර්යසාධන බැඳුම්කර ලබා ගත යුතු වේ. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් ප්‍රමාණ පත්‍රය තුළ ගෙවීම් අයිතම 119.2(1) ඇතුළත් කර තිබුණු අතර විශේෂ කොන්ත්‍රාත් කොන්දේසි මගින් පොදු කොන්දේසි සංශෝධනය නොකර කොන්ත්‍රාත්කරු විසින් දරන ලද කාර්යසාධන බැඳුම්කරයෙහි පිරිවැය සඳහා රු.මිලියන 1.75 ක වටිනාකමක් ගෙවා තිබුණි. | කෙසේ වුවද, ඉදිරි කොන්ත්‍රාත්වල මෙම ගෙවීම් අයිතම ඇතුළත් නොකිරීමට දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇත. | කොන්ත්‍රාත් කොන්දේසි සමාලෝචනය කළ යුතු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරනු ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |
| (ආ) | පැකේජ දෙකෙහි ප්‍රමාණ පත්‍ර අනුව, සිවිල් වැඩ ලෙස ප්‍රධාන වශයෙන් පවතින ව්‍යුහයන් ඉවත්කිරීම, ශ්‍රේබියන් බැමි ඉදිකිරීම, ඉංජිනේරුවරුන් සඳහා කාර්යාලය, ඉංජිනේරුවරුන් සඳහා මෙහෙයුම් හා රසායනාගාර යනාදිය සඳහා රු.මිලියන 38.66 ක් ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ වුවද, 2023 දෙසැම්බර් මාසයේ ගෙවන ලද අවසන් අතුරු ගෙවීම් සහතිකපත දක්වා මෙම අයිතම සඳහා කිසිදු ගෙවීමක් සිදු කර නොතිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට මෙම පැකේජවල භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 55 ක් සහ සියයට 74 ක් වුවද, මෙම ගෙවීම් අයිතම එදිනට කිසිදු ප්‍රගතියක් නොමැතිව පැවතීම සම්බන්ධව හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/1 ප්‍රතිසංස්කරණය හා පාලම් අංක 3/1 පුළුල් කිරීම සඳහා කොන්ත්‍රාත් පැකේජ RDA/MFAP/ICB/OFID-1/09 සහ RDA/MFAP/ICB/OFID-1/10 සඳහා ලංසු වෙන වෙනම කැඳවන ලදී. කෙසේ වුවද, එක් කොන්ත්‍රාත්කරුවකුට කොන්ත්‍රාත් දෙකම ප්‍රදානය කර තිබුණු අතර ඉදිකිරීම් දෙකම සඳහා එක් කාර්යාලයක් සහ එක් රසායනාගාරයක් පමණක් බිල්පත් අංක 01 යටතේ භාවිතා කර තිබුණි. බිල්පත් අංක 01 හි සඳහන් පාලම් අංක 3/1 ට අයත් සමහර අයිතම උපයෝජනය කර නොතිබුණු බැවින් එය රජයට ඉතිරිවීමක් වේ. තවද, ව්‍යාපෘති දෙකෙහි වැඩ කරගෙන යන විට ඉදිකිරීම් සම්බන්ධ බොහෝ අයිතම වර්තමානය වන විට උපයෝජනය කර ඇති අතර වැඩ බිමෙහි තත්ත්වය හේතුවෙන් අයිතම කිහිපයක් එසේම පවතිණි. | ප්‍රමාණ පත්‍ර අයිතම සමාලෝචනය කළ යුතු අතර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව සිදු කරනු ලබන සමාලෝචනයේදී ලිඛිත උපදෙස් ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ග කොටසේ (A005) පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම්වල නඩත්තු කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදුකර නොතිබුණි. එම නිසා, ඉහත වැඩවල නිවැරදිකිරීම් සහ නඩත්තු කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට රු.මිලියන 7.71 ක මුදලක් වැය වී තිබුණි. මා.සං.අ.ට ගෙවීමට ඇති වියදම 2019 සිට උපචිත වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 0.70 පමණක් කොන්ත්‍රාත්තරුගෙන් අයකර ගැනීමට ව්‍යාපෘතියට හැකි වී තිබුණි. ඇපකර මුදල් කර හිඟ ශේෂය කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ව්‍යාපෘතිය විසින් ගත යුතු වුවද, එම වටිනාකම වාරික 10 කින් පියවීමට ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට ඉඩ දී තිබුණු අතර ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට ලබා දී තිබුණු මෙම සහන සඳහා පදනම විගණනයට තහවුරු නොවුණි. | වාරික 10 කින් හිඟ ගෙවීම් පියවීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉල්ලීම් කර තිබුණු අතර මා.සං.අ. අධ්‍යක්ෂ ජනරාල් වෙත කරුණු යොමු කරන ලද අතර මා.සං.අ. අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අඩු කිරීම් කරනු ලැබේ. | කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරුගේ වගකීම් නිසි ලෙස සමාලෝචනය කළ යුතු අතර කොන්ත්‍රාත්කරුගේ හිඟ ශේෂය අය කර ගැනීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |

## 3.3 ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය හා ශ්‍රී ලංකා රජයේ සංරචක යටතේ පිළිවෙලින් රු.මිලියන 500.29 ක් හා රු.මිලියන 39.35 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ විදේශ ණය ප්‍රතිපාදනයෙන් රු.මිලියන 5.79 ක් හා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 3.84 ක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාව අනුව ණය නිකුත්කිරීම් ගිණුම් ගත කරනු ලැබේ. එම නිසා, ව්‍යාපෘතිය විසින් මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 419.07 ක් පෙන්වන ලදී. ඉතිරි වටිනාකම වූ රු.මිලියන 75.43 ක් ගිණුම් ගත නොකරන ලද අතර මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු විදේශ ආධාර ලෙස අප විසින් පෙන්වා ඇත. ඉල්ලීම් කළ පරිදි අග්‍රිම නොලැබීම හේතුවෙන් දේශීය අරමුදල් උපයෝජනය අඩු විය. | ණය අරමුදල් ඵලදායීව උපයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |